CMEV
**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**
**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**
**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**
No 6/5, Layards Road, Colombo 05, **Tel:** +094-11 3010664
**Fax**: +094-11 2505228 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2018

*මැතිවරණ දින මාධ්‍ය නිවේදනය - 02*

මෙම පළාත් පාලන ආයතන මැතිවරණයේදී මැතිවරණ නීති උල්ලංඝනය කිරිම සහ ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ යම් යම් සිදුවීම් වාර්ථා වී ඇතත්, සමස්තයක් වශයෙන් අවහිරතාවලින් තොර වාතාවරනයක් මේ දක්වා කාලය තුළ නිරීක්ෂණය වි ඇත. අද දින තුළ ප.ව 2.00 දක්වා ඉකුත් වූ කාලය තුල මැ.ප්‍ර.නි.ම වෙත වාර්ථා වී ඇති සිදුවීම් සංඛ්‍යාව 111 ක් වේ. මේ අතරින් සිද්වීම් 16 ක් බරපතල ගණයේ සිදුවීම් ලෙස වර්ගීකරණය කොට ඇති අතර සෙසු සිදුවීම් 95 සුළු සිදුවීම් ලෙස සැලකිය හැක.

දෙමළ ජාතික සංවිධානයේ ආධාරකරුවන් පිරිසක් විසින් මාළුවා ලකුණින් මැතිවරණය සඳහා තරග වදින ස්වාධීන අපේක්ෂක කේ.බාස්කරන් යන අයට පහර දුන් බව හා ඉන් ඉක්බිති ඔහුව රෝහල් කොට ඇති බව මැ.ප්‍ර.නි.ම වෙත වාර්ථා වී ඇත. මෙම සිදුවීම අම්පාර දිස්ත්‍රික්කයේ කරෛයිතිව් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුලදී සිදුව ඇති බව එම වාර්ථාවේ තව දුරටත් සඳහන් වේ.

එක්සත් ජාතික නිදහස් සන්ධානයේ පක්ෂ සළකුණ රැගත් අත් පත්‍රිකා බෙදමින් සිටියදී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවන් තිදෙනෙකු මන්සූරිය මාවත මන්සන්ධියේ දී පොලිස් අත්අඩංගුවට පත්ව ඇති බව මැ.ප්‍ර.නි.ම වෙත වාර්ථා විය. මෙම ආධාරකරුවන් DBP AAI 6623 සඳහන් අංක තහඩුව සහිත ත්‍රී රෝද රථයකින් ගමන් කරමින් සිටියදී මධ්‍යහන්න 12.10 ට පමණ සීතාවක පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන අනු අංක 354,365/2018 යටතේ අධිකරණයට ඉදිරිපත් කොට තිබේ.

එක්සත් ජාතික පක්ෂයෙන් කොළොන්නාව මහ නගර සභාව සඳහා තරග වදින අපේක්ෂිකා අමානා නිශාන්ධීන් යන අය හෙන්රි ඕල්කට් විදුහලේ ස්ථාපිත කොට ඇති ඡන්ද මධ්‍යස්ථානයට මෙදින උදෑසන සිටම කිහිපවතාවක්ම ඇතුල් වී ඡන්ද විමසීම් ක්‍රියාවලියට බාධා පමුණුවා ඇති බව මැ.ප්‍ර.නි.ම වෙත වාර්ථා වී ඇත.

කොළඹ දිස්ත්‍රික්කයේ පෙ.ව 11.30 ට පමණ ගොඩගම සුභාරතී මහ විද්‍යාලයේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථානයට මීටර් 50 ක පමණ දුර වූ ස්ථානයක ජනතා විමුක්ති පෙරමුණේ, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයින් සහ ඔවුන්ගේ ආධාරකරුවන්ගෙන් සමන්විත 50 දෙනෙකු හෝ 75 දෙනෙකුගෙන් යුත් පිරිසක් ඒකරාශී වී සිටි බවද පොලීසිය සහ ජ්‍යෙෂ්ඨ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරිවරයා එසේ රැස්ව සිටි පිරිස විසුරුවා හැරීමට අසමත් වූ බවද මැ.ප්‍ර.නි.ම වෙත වාර්ථා වී ඇත.

මැ.ප්‍ර.නි.ම වෙත පැමිණිල්ලක් යොමු කරමින් දෘෂ්‍යාබාධ සහිත පුද්ගලයන් තිදෙනෙක් පවසා සිටියේ තමන් හට මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද ඡන්ද කොට්ඨාසයේ නාලන්ද විහාරස්ථානයේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථානය තුලට තමා සමග ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සහය දක්වීමට අවශ්‍ය ලිපි ලේඛන ද සමග පැමිණි පුද්ගලයින් කැටිව යාමට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ ස්ථානාධිපතිවරයා විසින් අවසර ලබානොදුන් බවයි. ඒ වෙනුවට අදාල ඡන්ද මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ ස්ථානාධිපතිවරයා සහ තවත් පුද්ගලයකු විසින් ඔවුන්ගේ ඡන්ද සටහන් කිරීම සඳහා සහය ලබා දී ඇත. ඔවුන් තවදුරටත් පවසා සිටියේ තමුන්ට නොලැබුනු එම අවස්ථාව අවම වශයෙන් වෙනත් එක් දෘෂ්‍යාබාධ සහිත පුද්ගලයෙකුට හෝ අදාල ඡන්ද මධ්‍යස්ථානයේදී හිමි වී ඇති බව ඔවුනට දැනගන්නට ලැබුනු බවයි.

පළුගස්දමන මහ විද්‍යාලයේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථානයට මීටර් 400 ක් එපිටින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කණ්ඩායම් වශයෙන් රැස්වූ ආධාරකරුවන් විසින් ඡන්ද දායකයන් බිය ගන්වමින් තම තමන්ගේ පක්ෂයන්වලට ඡන්දය ලබා දෙන ලෙස බලපෑම් කරු ඇති බව මැ.ප්‍ර.නි.ම වෙත වාර්ථා වී ඇත.

කන්තලේ ප්‍රාදේශීය සභාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අපේක්ෂක චම්පික සංජීව සහ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් ඡන්ද දායකයන් හට ටී/වික්නේශ්වර විද්‍යාලයේ හා ටී/අග්‍රබෝධි ජාතික පාසලේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථාන වෙත දහවල් කාලයේ දී නීති විරෝධී ලෙස ප්‍රවාහන පහසුකම් සපයා තිබූ අතර ඒ සඳහා EP-5051 තහඩු අංක දරන ප්‍රවාහනයක් යොදා ගෙන තිබූ බව අප වෙත වාර්ථා වී ඇත.

කෑගල්ල දිස්ත්‍රික්කයේ අඹේපුස්ස ඡන්ද කොට්ඨාසයේ ඩඩ්ලි සේනානායක මහ විද්‍යාලයේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථාන වෙත ඇතුළුවීම සඳහා මැ.ප්‍ර.නි.ම නිරීක්කෂකයා හට ජ්‍යෙෂ්ඨ ඡන්ද මධ්‍යස්ථාන ස්ථානාධිපතිවරයා විසින් අවසර ලබානොදීමේ සිද්ධියක් ද මැ.ප්‍ර.නි.ම වෙත වාර්ථා වී ඇත.

පුත්තලම මහ නගර සභාව සදහා ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය නියෝජනය කරමින් තරඟ වදින අස්කි මොහොමඩ් යන අය පෙ.ව 11.00 ට පමණ මනොල්කුන්ඩු මුස්ලිම් විද්‍යාලයට මීටර් 50ක් එපිටින් සිය ආධාරකරුවන් සමග රැඳී සිටිමින් ඡන්ද දායකයින් හට බලපෑම් කරන ආකාරය එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂක එෆ්.ආර්.එම්.මුහුසි යන අය විසින් නිරීක්ෂණය කොට මැ.ප්‍ර.නි.ම වෙත වාර්ථා කොට තිබුනි. පෙ.ව 11.45 ට පමණ එම මුස්ලිම් කොන්ග්‍රස් අපේක්ෂකයා සහ ඔහුගේ ආධාරකරුවන් අදාල ඡන්ද මධ්‍යස්ථානය තුළටම ගොස් නීති විරෝධී ලෙස ඡන්ද ප්‍රචාරයේ යෙදෙන අයුරුද නිරීක්ෂණය වී තිබේ.

කුරුණෑගල දාරළුව ඡන්ද කොට්ඨාසයේ හෙට්ටිරිප්පු කණිෂ්ඨ විද්‍යාලයේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථානයේ ඉදිරිපස මධ්‍යහ්න කාලයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂක ගෝමස් කීර්ති හිඳ සිටි බව මැ.ප්‍ර.නි.ම වෙත වාර්ථා වී ඇත.

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සදහා එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වන අරුට්ටවලාගේ දිනුක්ෂ ඉල්ලන්ද යන අය මල්ලව කණිෂ්ඨ විද්‍යාලයේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථානය අසල රැඳී සිටිමින් ඡන්ද දායකයින් හට බාධාවන අයුරිනි හැසිරෙන අතර වෙනත් පක්ෂ වල අපේක්ෂකයින් පිළිබඳ අසත්‍ය ප්‍රකාශ සිදුකරමින් සිටි බව ප.ව 12.16 ට පමණ නිරීක්ෂණය විය.

සෑම පළාතකින්ම මැ.ප්‍ර.නි.ම වෙත ලැබෙමින් පවතින පැමිණිලි අතුරින් බොහෝමයක් නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණ කටයුතු, ඡන්ද දායකයින් හට බලපෑම් කිරීම සහ අපේක්ෂකයින්ගේ ප්‍රචාරණ පත්‍රිකා බෙදා හැරිම වැනි ආකාරවල සිදුවීම් ලෙස හඳුනාගත හැක.

**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාන්විතය**

මැ.ප්‍ර.නි.ම විසින් දිවයින පුරා ස්ථිතික නිරීක්ෂකයින් ද ඇතුළත්ව 2000 කට ආසන්න නිරීක්ෂකයින් සංඛ්‍යාවක් මැතිවරණ දිනය තුළ සිදුවන ප්‍රචණ්ඩක්‍රියා සහ මැතිවරණ ආශ්‍රිත නීති උල්ලංඝනය කිරීම් වැනි සිදුවීම් නිරීක්ෂණය කිරීමේ අරමුණින්, ඡන්ද මධ්‍යස්ථානවල හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල යොදවා ඇත.

මැ.ප්‍ර.නි.ම වර්ෂ 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංවිධානය එක්ව ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණයන්හි ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණයට ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට මැ.ප්‍ර.නි.ම විකල්ප ප්‍රතිපත්ති ක්‍රමවේදයෙන් සහ මානව හිමිකම් දත්ත කේන්ද්‍රයෙන් (INFORM) සමන්විත වේ.

මැ.ප්‍ර.නි.ම සියලු වාර්තා සහ මාධ්‍ය නිවේදන www.cmev.org වෙතින් ලබා ගත හැකිය.